ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2568 2025 පෙබරවාරි 12 නවම් කළාපය

දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති
ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,
කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

“අද අද එයි මරු පින් කර ගන්නේ ”

“අප්පමිදං භික්ඛවේ මනුස්සානං ආයු. ගමනීයෝ සම්පාරයෝ.
කත්තබ්බං කුසලං - චරිතබ්බං බ්‍රහ්මචරියං නත්ථි ජාතස්ස අමරණං”

(මාර සංයුක්ත, පඨම ආයු සූත්‍රය)

සුපින්වතුනි,

බුදුරජාණන්වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ වැඩ වාසය කරන කාලේ භික්ෂූන්ට මේ ධර්මය දේශනා කළ සේක. “මහණෙනි, මනුෂ්‍යයන්ගේ ආයුෂ බොහොම ටිකයි. හැම දෙනාටම පරලොව ගමන යන්න වෙනවා. ඒ නිසා හැම දෙනාම කුසල් රැස් කර ගන්න ඕන. බ්‍රහ්මචාරියේ හෙවත් නිවන් මගේ හැසිරෙන්න ඕන. උපන් කෙනෙකුට නොමැරී ඉන්න බැහැ. කවුරුන් හෝ මනුෂ්‍යයෙක් ගොඩක් කල් ජීවත් වෙනවා නම් ඒ අවුරුදු 100ක් හෝ ඊට ටිකක් අඩු හෝ වැඩි හෝ කාලයක් තමයි. ඊට වඩා ජීවත් වෙන්න බැහැ. මේ වෙලාවේ මාරයා ඇවිත් බුදුහාමුදුරුවන්ට මෙහෙම පැවසීය. “ඒක වැරදියි. මනුෂ්‍යයන්ට ගොඩක් ආයුෂ තියෙනවා. අම්මගේ තනේ එල්ලිලා කිරි බොන දරුවෙකු වගේ මේ මනුස්ස ජීවිතේ ගැන ආස කරන්න ඕන. ඔය කිව්වට මරණය ඔය තරම් ඉක්මනට එන්නේ නැහැ.”

එවිට බුදුහාමුදුරුවෝ මෙසේ වදාළහ. "මිනිසුන්ගේ ආයුෂ අඩුයි. සත්පුරුෂයා ඒ ආයුෂය හෙළා දකිනවා. ඒ නිසා හිස ගිනි ගත් මිනිහෙක් ඒ ගින්න නිවන්න මහන්සි ගන්නව වගේ චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කිරීමට ඉක්මනින් ක්‍රියා කරන්න ඕන. මරණය නැවත් ඉන්නේ නෑ.

තමාව හඳුනාගත් බව දුටු මාරයා එතැනම අතුරුදහන් වුණා.

අපි යම් දෙයක් පිළිබඳව තේරුම් ගැනීමට යොදා ගන්නා එක ක්‍රමයක් තමයි, ඒ දෙය තවත් දෙයක් සමග සසඳා බැලීම, සමහර තිරිසන් සත්තු මනුෂ්‍යයාට වඩා වැඩි කාලයක් ජීවත් වෙනවා. ඒ වගේම මිනිස් ලොව අවුරුදු 50ක්, චාතුර්මහාරාජික දිව්‍ය ලෝකෙට එක දවසයි. මිනිස් අවුරුදු 100ක් තාවතිංස දිව්‍යලෝකෙට එක දවසයි. අසංඛ්‍ය ගණන් ආයුෂ තියෙන බ්‍රාහ්මයන් ඉන්නවා. ඒ අයගේ ආයුෂත් එක්ක සසඳලා බැලුවම මිනිසුන්ගේ ආයුෂ ඉතා ටික බව පේනවා. ඒ වුණාට හුඟ දෙනෙක් කටයුතු කරන්නේ නොමැරෙන ය වගේ හිතාගෙන. බුදුහාමුදුරුවෝ දේශනා කළේ හිස ගිනි ගත් අයෙක් එම ගින්න නිවා ගැනීමට කටයුතු කරනවා වගේ. කාලය අපතේ නොයවා හැම මොහොතකම කුසල් රැස් කර ගන්න කියලා.

අද කාලෙ ගොඩක් දෙනෙක් වයස අවුරුදු 75, 80 විතර වෙන කොට මිය පරලොව යනවා. කලාතුරකින් අවුරුදු 100 පසු කළ අයත් හමු වෙනවා. පොල් මලක කොලපුව ඇතුළේ මල් ගොඩාක් තියෙනවා. ඒ වුණාට පොල් වල්ලේ ගෙඩි වැඩිම වුණොත් 20ක් විතර හැදේවි. අනෙක් මල් අකාලෙ හැලෙනවා. තව සමහර ඒවා ගොබලු කාලෙ වැටෙනවා. දිය ගොබලු කාලෙත් වැටෙනවා. වෑවර කාලෙත් වැටෙනවා. කුරුම්බා කාලෙත් වැටෙනවා. කලටි කාලෙත් වැටෙනවා. පැහෙන්න ඔන්න මෙන්න තිබිලත් වැටෙනවා. පැහිලා වේලුනාට පසුවත් වැටෙනවා. හැම සත්ත්වයෙක්මත් ඔය වගෙයි. උපන්දා සිට ඕනෑම වෙලාවක මැරෙන්න පුළුවන්, මව් කුසේදීත් මැරෙන්න පුළුවන්. "පණ නම් තැන අග පිණි බිඳු වැන්නේ" කියන්නේ ඒ නිසානේ.

මේ විදියට ටික කාලයක් ජීවත්වන අපට පරලොව ගමන යන්නම වෙනවා. (ගමනීයෝ සම්පරායෝ) ඒක නවත්වන්න මාරයා සමග ගිවිසුම් වලට එළඹෙන්න බැහැ. මාරයා අල්ලස් නොගන්නා නිසා අල්ලස් දීල මරණයෙන් ගැලවෙන්න බැහැ. මාරයා සමග යුද්ධයක් කරන්න තියෙනව. ඒකෙන් කවදාවත් අපට දිනන්න ලැබෙන්නේ නැහැ. මාරයාමයි දිනන්නේ. හේතු ප්‍රත්‍යන්ගෙන් යමක් ලෝකේ හට ගන්න නම් ඒ හේතු ප්‍රත්‍ය සම්බන්ධය බිඳ වැටීම නිසා හටගත් සියල්ල නැති වී යනවා. ළදරු කාලයටත් මහලු කාලයටත් ජීවිතෙන් භාගයක්ම ගත වෙනවා. ලෙඩ රෝග හා වෙනත් විපත්ති වලටත්, නිදාගන්නත්, ඉතිරි භාගෙන් අඩක් යනවා. අපට පරලොව යහපත සඳහා පින් කරගන්න තියෙන්නේ ජීවිතෙන් හතරෙන් එකක් පමණයි. ඒ සුළු මොහොතෙන් උපරිම ප්‍රයෝජන අරගෙන අපේ ජීවිතය මෙලොව හා පරලොව වශයෙන් සාර්ථක කරගන්න උත්සාහ ගන්න ඕන. බණ පදයක් අහන්නේ නැතිව සංසාරෙ බුද්ධාන්තර කීයක් නං ගත කරන්න ඇද්ද?

තව්තිසා දෙව්ලොව 'මාලාහාරී' නම්වූ දිව්‍යපුත්‍රයෙක් සිටියා. ඔහු දෙවඟනන් පිරිවරා විනෝදය සඳහා උයනට ගිය දවසක දෙවඟනන් ගස්වලට නැඟී තම ස්වාමියාට පැළඳවීමට මල් කඩමින් සිටියා. එයින් එක් දෙවඟනක් ගස් උඩ මල් කඩමින් සිටියදී චුත වී සැවත් නුවර කුල ගෙයක උපන්නා. උපන් විගස ඇයට ජාතිස්මරඥානය පහළ වී තමා පෙර භවයේ මාලාහාරී දෙව්පුතුගේ භාර්යාවක වී සිටි බව දැක්කා. වැඩිවියට පත්වූ පසු සුවඳ මල් පුදමින් යළිත් සැමියා ළඟම ඉපදීමට පැතුවා. සොළොස් වන වියේදී පතිකුලයට ගිය ඇය දානශාලාවක් සකස් කොට භික්ෂු - භික්ෂුණීන්ට දන්දීම, සිල් රැකීම ආදී නොයෙක් පින් කරමින් දෙව්ලොව සිටින තම සැමියා ළඟ ඉපදෙන්නට පැතුවා. ඇගේ මේ ප්‍රාර්ථනය ඇසූ මිනිස්සු ඇයට 'පතිපූජිකා' යයි නමක් පට බැන්දා.

බුදුහාමුදුරුවන්ගේ කාලෙ වගේම වර්තමානයේත් තිබෙන සියලු ආගම්වල අවසාන නිෂ්ටාව ලෙස පෙන්වා දෙන විමුක්තිය, මිය පරලොව ගියාට පසු ලැබෙන දෙයක්. එහෙත් බුදුදහමේ උගන්වන විමුක්තිය හෙවත් නිවන මේ ජීවිතයේදීම ලබාගතයුතු දෙයක් දිට්ඨේවධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති" යනුවෙන් ඒ බව දක්වල තියෙනව. ඒ නිවන මේ ජීවිතයේදීම තමන්ට අත්විඳින්න පුළුවන්. අපි ඒ සඳහායි උත්සාහ කළ යුත්තේ.

අපි හැමවිටම මරණයට මුහුණ දීලයි ඉන්නේ ඒ නිසා බුදුරජාණන් වහන්සේ අපට වදාරනවා කත්තබ්බං කුසලං - කුසල් කරන්න කියල. කුසල් කියන්නේ මොනවද? පිළිකුල් සහගත පාපධර්ම විනාශ කරන නිසා 'කුසල්' කියනවා. ඒ වගේම අපේ දුර්වලකම් නැති කරලා, අප තුළ හැකියාවන් වර්ධනය කරන නිසත් 'කුසල්'ය කියනව- සිත, කය, වචනය යන තිදොරින් දස අකුසල් සිදුවන බව අපි දන්නව. සිතෙන් අකුසල් තුනක්, කයෙන් අකුසල් තුනක් සහ වචනයෙන් අකුසල් හතරක් සිදුවෙනව. මේ දහය ලෝභ, දෝස, මෝහ යන කෙලෙස් තුන ට අයිති වෙනව. මේවායින් කිලිටි වුණු සිතකින් තමයි මේ අකුසල කර්ම කරන්න පෙළඹෙන්නේ. ඒවා යටපත් කරල මලාකාරයෙක් මල් මාලා ගොතන්නා වගේ, උපන් සත්වයා විසින් පින් කර ගන්න ඕන.

විමුක්තිය ලැබීම සඳහා බ්‍රහ්මචරිය වාසයෙහි යෙදෙන්නත් ඕන. (චරිතබ්බං බ්‍රහ්මචරියං) මේවා මේ ජීවිතයේදී සිදුකර නොගත හොත් මේ දීර්ඝ සංසාරේ නැවත ඒ සඳහා අවස්ථාවක් අපට ලැබෙයිද කියන්න බැහැ - විශුද්ධි මාර්ගයේ අනුස්සති කර්මස්ථාන නිර්දේශයේ මරණය ගැන මෙනෙහි කළ යතු ආකාර අටක් දක්වා තියෙනව.

මරණය, ගෙල සිඳීම අප පිටුපස සිටින වධකයකු විදියට හිතන්න මේ ජීවිත සම්පත්තිය මරණය නමැති විපත්තියෙන් කෙළවර වනබව හිතන්න. මට වඩා යසසින්, පිණින්, උත්සාහයෙන්, සෘද්ධියෙන් ප්‍රඥාවෙන් වැඩි අයත්, බුදු පසේබුදු මහරහතන් වහන්සේලාත් මේ මරණ ධර්මයට මුහුණ පෑවා නම් මා වැනියකු ගැන කවර කතාද? කියල හිතන්න . අන් අයටත් මටත් තියෙන්නේ සතර ධාතූන්ගෙන්

හැදුණු, කබලිංකාර ආහාරයෙන් වැඩුණු ශරීරයක්. ඒ අන් අයගේ ශරීර වගේම මගේ ශරීරයත් මේ ධාතූන් වෙනස් වීමෙන් අභාවයට පත් වෙනවා කියල හිතන්න. මගේ මේ ජීවිතය පවතින්නේ මා ආශ්වාස කිරීම හා ප්‍රශ්වාස කිරීම, ඉරියව් පැවැත්වීම, ආහාර ගැනීම සිදුකරන තුරුයි. කියල හිතන්න මේ ජීවිතය, අසවල් දින මැරෙනවා, අසවල් රෝගයෙන් මැරෙනවා, අසවල් වේලාවට මැරෙනවා, මළමිනිය අසවල් තැන වල දමනවා. මා මළ පසු අසවල් තැන උපදිනවා. යන මේ කරුණු පහ අවිනිශ්චිත බව සිතන්න. මේ කාලයේ හැටියට පරමායුෂ මෙපමණයි. ඊට වඩා කල් ජීවත් වෙන්න බැහැ කියල හිතන්න. තණ අග පිණි බිඳක් වගේ, වීදුරු භාජනයක් වගේ මේ ජීවිතය කුමන මොහොතක නැති වේදැයි කිව නොහැකි බව හිතන්න.

දිනක් මහානාම ශාක්‍යයා බුදුහාමුදුරුවන්ගෙන් අහනවා මං ඔබ වහන්සේ හෝ වෙනත් ස්වාමීන්වහන්සේ නමක් හෝ හමුවෙලා ආපසු යන කොට හදිසි අනතුරකින් මිය යන්න පුළුවන්, එහෙම වුණොත් ඊළඟ භවය කොහොම වෙයිද? කියල. යම් දිසාවකට බර වූ ගසක් තද සුළඟට හසු වුණොත් ගස බරවී තියෙන දිසාවටම පෙරලෙනව වගේ යමෙක් ජීවිත කාලය තුළ ශ්‍රද්ධාව, ශීලය ධර්මශ්‍රවණය, දන්දීම, ධර්මඥානය ලබාගෙන පුරුදු කරල තියෙනව නම් ඔහු මරණින් මතු සුගතියකම උපදින බව බුදුහාමුදුරුවෝ වදාළා. ඔබත් ජීවිතයට මේ පඤ්ච ධර්ම පුරුදු කර ගන්න. බය නැතිව මරණයට මුහුණ දෙන්න.

සැමට තෙරුවන් සරණයි!

විමසීම් : එස්.ඒ රෝහණ පෙරේරා (0770741958)